
# අපි ගිය
# විනෝද ගමන



සිතුලි දිලේන්‍යා සිල්වා
1 - E

# "අපි ගිය විනෝද ගමන"

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2023 නොවැම්බර්

කතාව සහ චිත්‍ර

## සිතුලි දිලේන්‍යා සිල්වා

1 ශ්‍රේණිය - E

මහාමායා බාලිකා විදුහල

# පිදුම

මට සැමදාමත් සෙවණැල්ලක් සේ මා හට දිරියක් වූ

මාගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්, නංගිත්

මගේ ආච්චිලා හා සීයලා

යන සියලු දෙනාටත්

මගේ *1 E* ශ්‍රේණියේ පංති භාර ගුරුතුමිය වන

දිල්රුක්ෂි ඊශ්වරගේ ගුරු මෑණියන්ටත්

මේ අවස්ථාව මට ලබා දුන් මාගේ ආදරණීය

මහාමායා විදුහල් මෑණියන්ටත්

මේ මගේ පොත් පිංච

ගෞරයෙන් යුතුව පුද කර සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.
2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු!

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

**ශෂිකලා සේනාධීර,**
**විදුහල්පතිනිය,**
**මහාමායා බාලිකා විද්‍යාලය,**
**මහනුවර.**
**2023.10.20**

අපි ගෙදරින් බෑග් ලෑස්ති කරගෙන රෑ නිදා ගත්තා. ඊට පස්සේ උදේ අපි ඉස්කෝලෙට ගියා.



අපේ මැඩම් එක්ක අපි බස් එකට නැග්ගා.

ඊට පස්සේ බස් එකේ ජනේල් ඇරගෙන වැව දිහා

බලාගෙන සිංදු කිය කියා නට නටා ගියා.



ඊට පස්සේ මග බස් එක නවත්තලා උදේ කෑම එක කෑවා. සමහර ළමයි බීම, පාන්, බිස්කට් ගෙනාවා.




මාත් පාන් ගෙනාවා. ඒවා කාලා බස් එකේ නැගලා අපි ආයෙත් සිංදු කිව්වා. නට නටා ගියා.



ඊට පස්සේ අපි අලි බලන්න ගියා. එතනදී ෆොටෝ ගත්තා. අලි බැලුවා. අලින්ට කෑම දුන්නා.



ඊට පස්සේ අලි නානවා බලන්න ගියා. අලි පැටවු හිටියා. නානවා දැක්කා.




එතන ඉඳලා අපි අයිස් ක්‍රීම් කෑවා. ටිකකින් අපි සත්තු වත්තට බස් එකේ ගියා. එතන හිටියා කොටියා, සිංහයා, බූරුවෝ, වලහා. කුරුල්ලෝ කූඩුවල දාලා හිටියා.






කිඹුලවත් දැක්කා. එතන පිට්ටනියේ අපි ඉඳගෙන කෑම කෑවා. කෑම කාලා ආයෙත් සත්තු බලන්න ගියා.



කුරුල්ලෝ බිත්තර දාලා, ඒවා රැකගෙන ඉන්නවා දැක්කා. අපි ගොඩක් සත්තු බැලුවා. ඊට පස්සේ බස් එකේ නගින්න එද්දී වැස්සක් ආවා.



අපි දුවලා තෙමිලා බස් එකට නැග්ගා. ඊට පස්සේ ආයෙත් සිංදු කිය කියා බස් එකේ ආවා.



අපේ මැඩම් කේක්, අග්ගලා එක්ක බීම බෝතලයක් දුන්නා. ඉතින් ඊට පස්සේ අපි නට නටා ආයෙත් ඉස්කෝලෙට ආවා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම්, දැනීම්, නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ**

**2023.10.20**